# MINISTRY OF EDUCATION

අධ්‍යාපන අමාත්‍යාංශය

## G.C.E. ORDINARY LEVEL - Rehearsal Paper

අ.පො.ස. (සා/පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍ර

## SINHALA

සිංහල

# QUESTION PAPER - III

# ප්‍රශ්න පත්‍රය - III



අනුග්‍රහය :

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - III**

**අ.පො.ස. (සා / පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය - පැය 02 යි**

- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6 , 7 යන ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (1) සිට (10) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

1. යස දිගත ඇන්දේ
   විජය සිරි සඳ ගෙන වැලැන්දේ
   (අ) මෙහි දිසාවන්හි ඇන්දේ කුමක් ද?
   (ආ) මෙහි දැක්වෙන කාව්‍යාලංකාරය දක්වන්න.

2. "කිමද දරුයෙනි"
   "මෙහි <u>ඇසෙන දෙයක්</u> ඇත."
   (අ) මෙම සංවාදය උපුටා ගත් කතාවේ නම ලියන්න.
   (ආ) මෙහි ඉරි ඇඳි පදය වර්තමාන ලේඛන ව්‍යාවහාරයට හරවා ලියන්න.

3. (අ) සිංහබාහු නාට්‍යයේ කතා සාරය උපුටාගත් කෘතිය කුමක් ද?
   (ආ) නාට්‍යයේ නිර්මාණකරුවා කවුද?

4. රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
   පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
   ......................................................
   ......................................................
   (අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) මෙම පද්‍යයෙහි ඇතුළත් දාර්ශනික කාව්‍ය සංකල්පනාව කුමක් ද?

5. " වර්ෂාවක් වැස පායන්නාක් මෙන් කතාබහ ද කාලයක් සමඟ තුරුල් වී යන්නට විය."
   (අ) ඉහත පාඨය උපුටා ගත් පාඩමේ නම කුමක් ද ?
   (ආ) මෙහි ඇතුළත් රූඪී පදය ලියන්න.

6. කුළින් කුළම සිහිල්'ඹ වැහෙන කඳුරුය
   දොළින් දොළම කල් යල් කරන කුඹුරුය
   පළින් පළම තල් පොල් ගෙවතු මැදුරුය
   තළින් තළම පුල් පියුමු'පුල පඬරුය
   (අ) මෙම පද්‍යය උපුටා ගත්තේ කිනම් ග්‍රන්ථයෙන් ද?
   (ආ) මෙහි 'පළින් පළම' ,'තළින් තළම' යන පදවලට අර්ථ විවරණය සපයන්න.

7. "මාගේ ශිල්පය දක්නා කැමති නියා වනැයි"
   (අ) මෙසේ සිතුවේ කවුද?
   (ආ) මෙම කතාවට පදනම් වූ මූලාශ්‍රය කුමක් ද?

8. දහසක් වැව් බැඳි යෝද මිනිස් කැල
   යොළි ඉපදී ඇති මවු දෙරණේ
   සත් රුවනින් නව නිදහන් මතු වී
   පුතුගෙ සිනාවෙනි ඔප වටුණේ
   (අ) කවියා ආර්ථික ශක්තිය සටහන් කළ කවි පදය උපුටා ලියන්න.
   (ආ) 'දහසක් වැව්' , 'යෝධ මිනිස්' යන පදවල ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දෙන්න.

9. (අ) මහින්ද හිමි විසින් ලියන ලද ජාතිකාභිමානී කෘති දෙකක් නම් කරන්න.
   (ආ) උන් වහන්සේ විසින් රචිත ළමා පද්‍ය නිර්මාණ දෙකක් ලියන්න.

10. "යහපත් නැකතකින් වහා නික්මුණ මැනව"
   (අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?
   (ආ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථය ලියවුණ සාහිත්‍ය යුගය කුමක් ද?

02. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

1. එන්නේ කොහි සිට ද කොතනකට ද යන්නේ
   ඔබ කුමකට ද මා දුටු තැන් විමසන්නේ
   මිනිසුන් ගිහින් නිතර ම ආපසු එ න් නේ
   කිම දැයි කියා කිසිවෙකු ඇයි? නො සොය න්නේ

   (අ) ඉහත පද්‍යයෙන් කවියා ව්‍යාංග්‍යාර්ථවත් කළේ කුමක් ද?
   (ආ) මෙහි සඳහන් ජනකාව්‍ය ලක්ෂණයක් පෙන්වා දෙන්න.

2. "ඒ විද්දත් දුවගේ භාව හාව ලීලා දැක වායෝධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නියා ය යි නොසිතා"

   (අ) බලවත් වූ ප්‍රේමය ඇති වූයේ කා වෙනුවෙන් ද ?
   (ආ) ඉහත පාඨය ලිහිල් බසින් ලියන්න.

3. පවන ද පිපි තු රේ ය නිර තුරේ ය
   කුසුමන් පෙති තු රේ ය මළු තුරේ ය
   අවට සුපිපි සි රේය බිඟු සරේ ය
   සිත එවෙහෙර කෙ රේ ය ලොබ කෙරේ ය

   (අ) මිනිසුන්ගේ සිත ආශා කළේ කිනම් වස්තුවකට ද ?
   (ආ) 'අවට සුපිපි සිරේය බිඟු සරේය' යන්න ලිහිල් බසින් ලියන්න.

4. 'හොඳයි මං ඔයාට දෙන්නම් ප්‍රන්කු හාරසියයක් ලස්සන ඇඳුමක් ගන්න උත්සාහ කරල බලන්න.'

   (අ) මෙම ප්‍රකාශය කරන්නේ කාට ද?
   (ආ) මෙම ප්‍රකාශය කරන පුද්ගලයා තුළ දක්නට ලැබෙන ගුණාංගය කුමක් ද?

5. ‘ඔය දැල දොඩමලු ය සුවඳ බැරුවා ඉන්ට
නිල් වතුර තුරුලු කර කෙසේ අතහැර යම්ද
කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන
සොඳුර නුඹ වාගේ ම හිනැහේය මා එක්ක’

(අ) ‘ඔය දැල දොඩමලුය’ යන්නෙන් ව්‍යංග්‍යාර්ථවත් කරන්නේ කුමක් ද?
(ආ) කවියා සොඳුර උපමා කරන්නේ කුමකට ද? එහි උපමා උපමේය වෙන් කර පෙන්වන්න.

03. (1) මහෞෂධ පණ්ඩිතයන්ගේ ස්ථානෝචිත ප්‍රඥාවත්
(2) කේවට්ට බමුණාගේ ආත්මාර්ථකාමී බවත්
උම්මග්ග ජාතක කතාකරුවා නිරූපණය කර ඇත්තේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 15)

<u>නැතහොත්</u>

(1) ජන කවියේ ඇති අව්‍යාජත්වයත්
(2) කුරහන් ගොවියා මුහුණ දෙන අභියෝගත් කුරහන් ඉසිමුව කළුවර බලාලා යන පද්‍ය නිර්මාණය ඇසුරින් විමසන්න. (ලකුණු 15)

04. (1) සත්ව චර්යා
(2) මානව චර්යා
ඇසුරින් ගුත්තිල කවියා වීණා වාදනයේ මිහිරියාව පෙන්වූයේ සජීවී දසුන් මවාලමිනි. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

<u>නැතහොත්</u>

(1) අවස්ථා නිරූපණයක්
(2) චරිත නිරූපණයක්
ඇසුරෙන් උග්ගසේන තරුණයා ජීවිත අභියෝග ජයගත් ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 15)

05. බැද්දේගම නවකතාවේ රසවත් භාවයට කතුවරයා යොදා ගත් භාෂාව හේතු වූ බව උදාහරණ තුනක් වත් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. ‘මුනි සිරිපා සිඹිමින්නේ යන පද්‍ය නිර්මාණය රසවත් වන්නේ කවියා යොදා ගත් කාව්‍යෝපක්‍රම හේතුවෙනි.’ නියමිත කොටසින් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. ‘සිහින ලෝකයක ජීවත් වීම බොහෝ ව්‍යසනයන්ට හේතුවන බව’ දියමන්ති මාලය නම් කෙටිකතා ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)